# විදේශ කටයුතු අමාත්‍යාංශය
## කොන්සියුලර් අංශය
## ලේඛන සත්‍යාපනය සඳහා මාර්ගෝපදේශ

කොන්සියුලර් අංශයේ සත්‍යාපනය කිරීමේ ඒකකය මඟින් සිදු කරනු ලබන්නේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සහතික පත්‍ර හා ලේඛන ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද නිසි බලය සහිත නිලධාරියෙකු විසින් ව්‍යවස්ථාපිත අධිකාරිමය වගකීමක් යටතේ නිකුත් කරන ලද නිවැරදි හා සත්‍ය ලේඛනයක් බවට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තහවුරු කිරීමයි. ඒ අනුව ඔබ විසින් ඉදිරිපත් කරන ලද සෑම ලේඛනයක්ම අව්‍යාජත්වය හා විශ්වාසනීයත්වය යථා පරිදි තහවුරු කරගැනීමෙන් අනතුරුව පමණක් සත්‍යාපනය කිරීම සිදු කෙරේ.

පහත සඳහන් උපදෙස් හා මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමෙන් ඔබගේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීමට හැකි වනු ඇත. **මෙකී උපදෙස්වලට අනුකූල නොවන ලේඛන සත්‍යාපනය කිරීම පිණිස භාර ගැනීමට නොහැකි වන බව කාරුණිකව සලකන්න.**

**පොදු කරුණු :**

01. සත්‍යාපනය කිරීම පිණිස ලේඛන භාර දෙන අය විසින් වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් හඳුනාගැනීමේ ලේඛන පමණක් මෙම අංශය විසින් පිළිගනු ලැබේ.
    - ❖ ශ්‍රී ලංකා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
    - ❖ ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ වලංගු ගමන් බලපත්‍රය
    - ❖ ශ්‍රී ලංකා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ වලංගු රියදුරු බලපත්‍රය
    - ❖ විදේශිකයෙකු නම් තම රටෙහි බලයලත් ආයතනය විසින් නිකුත් කළ ගමන් බලපත්‍රය (විදේශීය සේවාලාභීන්ගෙන් අය කරන ගාස්තුව අය කෙරේ.)

සැ.යු.- වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකා රජය මඟින් නිකුත් කළ ඉහත සඳහන් වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් ඉදිරිපත් කළහොත් පමණක් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අය කරන සේවා ගාස්තුව යටතේ සේවය ලබා ගත හැකිය.

02. සහතික පත්‍ර සත්‍යාපනය කර ගැනීම සඳහා අදාළ සහතිකවල අයිතිකරුම පැමිණීම අපේක්ෂා කරන අතර, එසේ පැමිණීමට නොහැකි අවස්ථාවකදී පැමිණෙන තැනැත්තාගේ
    - ❖ සම්පූර්ණ නම
    - ❖ ජාතික හැඳුනුම්පතේ අංකය
    - ❖ පදිංචි ලිපිනය

පැහැදිලිව සඳහන් කර,සහතික පත් හිමිකරු විසින් නිකුත් කළ බලය පැවරීමේ ලිපියක් සහ සහතික පත්‍ර අයිතිකරුගේ ගමන් බලපත්‍රයේ පිටපතක් සමග කොන්සියුලර් අංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සහතික පත්‍ර අයිතිකරුට වලංගු ගමන් බලපත්‍රයක් නොමැති නම්, අදාළ බලය පැවරීමේ ලිපිය තමන් පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී ඉදිරියේ අත්සන් කර ග්‍රාම නිලධාරීගේ අත්සන සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුය.

එවැනි ලේඛන සත්‍යාපනය කිරීමට භාර ගැනීම පිළිබඳව අවසන් තීරණය කොන්සියුලර් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් සතු බව කාරුණිකව සලකන්න.

03. වයස අවුරුදු 18ට අඩු දරුවන්ගේ සහතික සත්‍යාපනය කර ගැනීම සඳහා අදාළ දරුවන්ගේ නීත්‍යානුකූල භාරකරු හෝ භාරකරු විසින් බලය පවරන ලද ලිපියක් රැගෙන පැමිණීම අවශ්‍ය වන අතර භාරකරුගේ ගමන් බලපත්‍රයේ පිටපතද ඉදිරිපත් කළ යුතුය. (මෙහිදී තුන්වන පාර්ශවයක් මගින් සේවාව ලබා ගැනීම පිළිබඳ උපදෙස් අදාළ වේ.) තවද දරුවන්ගේ දෙමාපිය/භාරකාරත්වය සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුය. **මේ සඳහා දරුවන් රැගෙන ඒම අවශ්‍ය නොවේ.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන කාඩ්පත සමඟ පැමිණෙන අයට ද ඉහත කරුණු අදාළ වේ.

04. සත්‍යාපනය කිරීම සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

05. ව්‍යාජ ලේඛන සත්‍යාපනය කර ගැනීම පිණිස හෝ ලේඛන ඉක්මනින් සත්‍යාපනය කර ලබා ගැනීම සඳහා කිසිදු පාර්ශවයකට මුදල් ලබා දීමෙන් වලකින ලෙස තරයේ දැනුම් දෙන අතර මෙම ගොඩනැගිල්ලේ සෑම ප්‍රදේශයක්ම ආරක්ෂිත කැමරා මගින් නිරීක්ෂණය කරනු ලබන බැවින් එවැනි කාර්යයන්ට සම්බන්ධ වන ඕනෑම අයෙකු නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දැනුම් දෙනු ලැබේ.

06. **ප.ව 1.30 න් පසුව** වේලාවන් වෙන් කිරීම (Appointments)අදාළ දිනට අත්හිටුවන බැවින් කිසිදු නිළධාරියෙකු හමුවී ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කිරීමෙන් වළකින්න. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන සහතික සත්‍යාපනය කිරීම **පෙ.ව.7.30 සිට ප.ව 3.00** දක්වා සිදු කෙරේ.

07. එක් ලේඛනයක් සත්‍යාපනය කිරීම සඳහා ගාස්තු පහතින් දැක්වේ.(2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 2017.11.09 දින නිකුත් කරනලද අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව සංශෝධිත ගාස්තු පහත පරිදි වේ.)

- ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන් රුපියල් 800/= ක් ද
- විදේශිකයෙකුගෙන් රුපියල් 1500/= ක් ද
- විභාග දෙපාර්තුමේන්තුව මගින් පවත්වන විභාග වෙනුවෙන් එම දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන සහතික සඳහා රුපියල් 500/= ක් ද (මේ සඳහා විභාග දෙපාර්තුමේන්තුව වෙනමම සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.)

- මෙම කාර්යාලයේ අනුමත වාණිජ්‍ය මණ්ඩලයක් විසින් සහතික කරන ලද අපනයන ලේඛන කට්ටලයක් සත්‍යාපනය කිරීම සඳහා රුපියල් 6000/= ක ගාස්තුවක් ද අය කෙරේ.

සියලුම ගෙවීම් අදාල ගෙවීම් කවුළුවලට පමණක් මුදලින් හෝ ණය/හර කාඩ්පත් මඟින් පමණක් ගෙවීමට කටයුතු කරන්න. සෑම ගෙවීමක් සඳහාම රිසිට් පත්‍රයක් නිකුත් කරන අතර තමන් විසින් ගෙවන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණයම නිවැරදිව සටහන් ව තිබේ දැයි කවුන්ටරයෙන් පිටත් වීමට පෙර පරීක්ෂා කිරීම ඔබගේ වගකීමකි.

08. කිසිදු ඡායා පිටපත් ලේඛනයක් සත්‍යාපනය කිරීම පිණිස භාර නොගැනේ. තවද සෑම ලේඛනයක්ම පරිලෝකනගත (Scan) කරන බැවින් දිරාපත් වූ හෝ පළුදු වූ ලේඛන ඉදිරිපත් කිරීමෙන් වළකින්නේ නම් මැනවි.

09. කිසියම් ආයතනයකට හෝ විදේශ තානාපති කාර්යාලයකට යොමුව සටහන් කොට ඇති කිසිදු ලිපියක් සත්‍යාපනය කිරීම පිණිස භාර ගනු නොලැබේ.

10. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ශ්‍රී ලංකා රජයේ ආයතන මගින් නිකුත් කර ඇති මූලික ලේඛන පමණක් සත්‍යාපනය කිරීම පිණිස භාර ගනු ලැබේ.

11. පරිවර්තනය කරන ලද ලේඛන සත්‍යාපනය කිරීම පිණිස පහත ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

11.1 පරිවර්තිත ලේඛන සත්‍යාපනය කිරීම පිණිස මුල් ලේඛනය ද අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු අතර අදාල පරිවර්තිත ලේඛනවල අන්තර්ගතය මුල් ලේඛනයේ අන්තර්ගතයට සමාන විය යුතුය.

11.2 පරිවර්තිත ලිපි ලේඛන සත්‍යාපනය කරනු ලබන්නේ එම පරිවර්තන අධිකරණ අමාත්‍යාංශයේ ලියාපදිංචි දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු විසින් පරිවර්තනය කරනු ලැබ ඇත්නම් පමණි. දිවුරුම් දුන් භාෂා පරිවර්තකයා ඔහුගේ/ඇයගේ ලිපි ශීර්ෂයෙහි හෝ මුද්‍රාවෙහි තමාට පරිවර්තනය කිරීමට බලය ඇති භාෂා පැහැදිලිව සඳහන් කළ යුතුය. අධිකරණ අමාත්‍යශයේ ලියාපදිංචි දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් පිළිබඳ විස්තර එම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

11.3 සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි ලේඛනයක් වෙනත් විදේශ භාෂාවකට පරිවර්තනය කරන්නේ නම් මුල් ලේඛනයේ විස්තර සාරාංශයක් ඉංග්‍රීසි බසින් පරිවර්තිත ලේඛනයේ සඳහන් කළ යුතුය.

11.4 සිංහල, දෙමල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිබාහිර වෙනත් විදේශ භාෂාවකට ඉහත පරිදි පරිවර්තනය කරනලද ලේඛන භාර ගනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයෙන් අදාළ භාෂා පරිවර්තකයාගේ ලියාපදිංචිය පිළිබඳව සහතික කර තිබේ නම් පමණි.


11.5 කිසියම් විදේශ භාෂාවකට අයත් ලේඛනයක් පරිවර්තනය කර ගැනීම සඳහා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු අධිකරණ අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති අවස්ථාවක, එකී විදේශ භාෂාව නිල භාෂාවක් ලෙස පිළිගැනෙන රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පිහිටි තානාපති කාර්යාලයක් මඟින් අදාළ පරිවර්තනය සත්‍ය හා නිවැරදි බවට සහතික කොට ඉදිරිපත් කළ යුතුය. එවැනි තානාපති කාර්යාලයක් ශ්‍රී ලංකාවේ පිහිටා නොමැති විටදී, අදාළ රට, ශ්‍රී ලංකාවේ නියෝජනය කිරීමට අක්ත බලයලත් ආසන්නම රාජ්‍යයක පිහිටි එම රටෙහි තානාපති කාර්යාලය මගින් ඉහත කී පරිදි සහතික කොට එකී ආසන්නම රාජ්‍යයෙහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින්ද සහතික කොට ඉදිරිපත් කරන ලේඛන පමණක් සත්‍යාපනය පිණිස භාරගත හැකිය.

11.6 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කර ඇති ලේඛන හැකිතාක් දුරට එම දෙපාර්තුමේන්තුවේම දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු මගින් පරිවර්තනය කර ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන් දිරි ගන්වනු ලැබේ.

12. ලේඛන භාර දෙන අවස්ථාවේදී සත්‍යාපනය කර ගැනීමට අවශ්‍ය ලේඛන පිළිබඳව අදාළ නිලධාරීන් නිවැරදිව සහ පැහැදිලිව දැනුවත් කිරීමෙන් ඔබ මෙන්ම කාර්ය මණ්ඩලයද අපහසුතාවයන්ට පත්වීම අවම කර ගත හැකි වනු ඇත. **<u>එසේම ඔබගේ නම නිවැරදිව සටහන් විය යුතු ආකාරය, ජංගම දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය නිවැරදිව සටහන් කර දීමත් එය නිවැරදි බවට වේලාවන් වෙන් කරන කවුළුවේදී පරිගණක තිරයේ පරික්ෂාකර බලා සනාථ කිරීමත් ඔබගේ වගකීමකි.</u>ඔබගේ ලේඛන සත්‍යාපනය කිරීමෙන් අනතුරුව මෙම දත්තයන් නිවැරදි කළ නොහැකි බව කාරුණිකව සලකන්න. නැවත නිවැරදි දත්ත ඇතුලත් කොට ලේඛන සත්‍යාපනය කිරීමට නැවත ගාස්තු ගෙවිය යුතුවේ.**

13. ලේඛන සත්‍යාපනය කිරීමේ විද්‍යුත් ක්‍රමවේදය (Electronic Document Attestation System) අනුව සත්‍යාපනය කරන ලද ලේඛන සඳහා අනන්‍ය අංකයක් නිකුත් කරනු ලබන අතර සත්‍යාපනය කරන ලද සියලුම ලේඛන ආරක්ෂිත විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ විදේශ තානාපති කාර්යාල මගින් ලබාගෙන ඉදිරි කටයුතු සඳහා භාවිතා කෙරේ.සත්‍යාපනය කරන ලද විද්‍යුත් ලේඛනය සමග ඔබගේ මුල් ලේඛනය ද අදාළ තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

14. කිසියම් විදේශීය ආයතනයක් මගින් නිකුත් කර ඇති ලේඛනයක් සත්‍යාපනය කිරීම සඳහා භාරගනු ලබන්නේ එකී ලේඛනය අදාළ රටෙහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හෝ ශ්‍රී ලංකාවෙහි අදාළ රට නියෝජනය කරන තානාපති කාර්යාලය විසින් සහතික කොට ඇතිවිට පමණි. (කරුණාකර රූපය බලන්න)




15. ඔබගේ ලේඛන නැවත භාරගැනීමේදී සත්‍යාපනය කරනලද සියලුම ලේඛනවල මුල් පිටපත් හා මුදල් ගෙවූ රිසිට්පත් සමග සත්‍යාපනය කරන ලද ලේඛනවල ඔබගේ පිටපත නිසි පරිදි ලැබී ඇති බවට පරීක්ෂාකර බලා රැගෙන යාමෙන් ඔබ සහ ආයතනය පත්වන අපහසුතා අවම කර ගැනීමට හැකි වනු ඇත.

16. සත්‍යාපනය කරන ලද ලේඛනයක්, සත්‍යාපනය කළ දින සිට <u>**වර්ෂයක්**</u> දක්වා වලංගු වනු ඇත.

17. අන්තර්ජාලය ඔස්සේ අපගේ නිල වෙබ් අඩවිය වෙත පිවිස (www.mfa.gov.lk) තත්කාලීන වේලාවන් වෙන් කර ගැනීම (online appointment) සිදු කර ගත හැකි වේ.

**පහත දක්වා ඇති ලේඛන වර්ග, ඒ එක් එක් ලේඛන වර්ගය යටතේ දක්වා ඇති නිර්ණායකයන් සම්පූර්ණකර ඇත්නම් පමණක් මෙම කාර්යාලය මගින් සත්‍යාපනය කිරීම හෝ සත්‍ය පිටපත් බවට සහතික කිරීම පිණිස භාරගන්නා අතර එකී නිර්ණායකයන් සම්පූර්ණ නොකරන ලද ලේඛන ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කාරුණිකව සලකන්න.**

**මෙහි පහත දක්වා ඇති ලේඛන වර්ගවලට අයත් නොවන කිසිදු ලේඛනයක් සත්‍යාපනය කිරීම පිණිස භාරනොගන්නා අතර ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් වලකින ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## 1. උප්පැන්න , විවාහ සහ මරණ සහතික හා සිවිල් ලේඛන

- 2008.01.01 දිනට පෙර නිකුත් කර ඇති උප්පැන්න, විවාහ, මරණ සහතික හා අනුමාන වයස් සහතික සත්‍යාපනය කිරීම සඳහා භාරගනු ලබන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයේ දත්ත පද්ධතියෙන් හෝ මුල් ලේඛනයෙන් 2008.01.01 දින හෝ එදිනට පසු දිනෙක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සහතිකකර නිකුත් කළ මුල් පිටපතක් පමණි. මෙහි මුල් පිටපත යනුවෙන් අදහස් වන්නේ අදාළ උපත, විවාහය හෝ මරණය සිදුවූ අවස්ථාවේදී එය ලියාපදිංචි කරන රෙජිස්ට්‍රාර්වරයා අත්සන් කොට අයදුම්කරු අතට ලබා දෙන ලේඛනය නොව, අදාළ උපත, විවාහය හෝ මරණය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව එම කාර්යාලයේ දත්ත පද්ධතියේ හෝ මුල් ලේඛනයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සහතික කොට ලබාදෙනු ලබන ලේඛනයයි. (උපත, විවාහය හෝ මරණය සිදුවූ අවස්ථාවේදී එය ලියාපදිංචි කරන රෙජිස්ට්‍රාර්වරයා අත්සන් කොට අයදුම්කරු අතට ලබා දෙන ලද සහතිකයම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා සත්‍ය සහතිකයක් බවට නැවත සහතික කොට ඇත්නම් සත්‍යාපනය කිරීම පිණිස භාරගැනීමට සලකා බැලිය හැකිය.)

- ලේඛන සෙවීමේ ප්‍රතිඵල සටහන් සහතිකපත්‍රවල හිස් ප්‍රතිඵල ලෙස සටහන් වී ඇති ලේඛන සත්‍යාපනය කරනු ලබන්නේ අදාළලේඛනය පිළිබඳ දත්තය කිසිදු රෙජිස්ට්‍රාර් කාර්යාල ලේඛනාගාරයක හෝ කොළඹ, මාලිගාවත්තේ පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල මධ්‍යම ලේඛනාගාරයේ හෝ සටහන්ව නොමැති බවට එනම් දෙවන පිටපත ද නොමැති බවට තහවුරු වන්නේ නම් පමණි.

- මුස්ලිම් දික්කසාද සහතික එකී සහතිකය නිකුත් කළක්වාසිවරයාට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බලය ලත් නිලධාරියකු විසින් සහතික කොට ඉදිරිපත් කළ යුතුය.

## 2. අවිවාහකත්වය සනාථ කිරීමේ සහතික

- අවිවාහකත්වය සනාථ කිරීමේ සහතික ලබා ගැනීම සඳහා අදාළ දිවුරුම් ප්‍රකාශයේ **විවාහ අපේක්ෂිත පුද්ගලයාගේ විදේශ ගමන් බලපත්‍ර අංකය** අනිවාර්යයෙන්ම සටහන් විය යුතු අතර එය ඉදිරිපත් කළ හැක්කේ අදාළ විවාහ අපේක්ෂිතයා, ඔහුගේ / ඇයගේ මව හෝ පියා හෝ එම පවුලේම සහෝදර සහෝදරියන්ට පමණි. (විදේශික පුරවැසිභාවය හිමි අය සඳහා අවිවාහකත්ව සහතික සත්‍යාපනය කිරීමට භාර ගනු නොලැබේ.)

- නීතිඥයකු හෝ සාම විනිසුරුවරයකු ඉදිරියේ කළයුතු මෙම දිවුරුම් ප්‍රකාශයෙහි ශ්‍රී ලංකාව තුළ අදාළ පුද්ගලයා අවිවාහකව සිටි බව, එම පුද්ගලයාට විවාහයක් කර ගැනීම සඳහා කිසිදු නීතිමය බාධාවක්

නොමැති බව සහ විවාහ අපේක්ෂිතයාගේ හා ප්‍රකාශකයාගේ ඥාතී සම්බන්ධය ප්‍රකාශ කිරීම හැර වෙනත් තොරතුරු ඇතුළත් නොකළ යුතුය.

- මෙම දිවුරුම් ප්‍රකාශ නීතිඥයකු ඉදිරියේ සිදු කළේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරීවරයා ද සාම විනිසුරුවරයෙකු ඉදිරියේ සිදුකළේ නම් අධිකරණ අමාත්‍යාංශයේ සාම විනිසුරු අංශයේ බලයලත් නිලධාරියකු මගින් සහතික කර තිබිය යුතුය.

- මෙම දිවුරුම් ප්‍රකාශය සමග විවාහ අපේක්ෂිත පුද්ගලයාගේ වලංගු ගමන් බලපත්‍රයේ සත්‍ය පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

- විදේශයක වාසය කරන ශ්‍රී ලාංකික පුරවැසියකුට තමන් සිටින රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ගොස් කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ බලයලත් නිලධාරියකු ඉදිරියේ මෙකී දිවුරුම් ප්‍රකාශය ලබා දිය හැකිය.

- අවශ්‍යනම් අවිවාහකත්වය සනාථ කිරීමේ දිවුරුම් ප්‍රකාශයක ආදර්ශ ආකෘතියක් මෙම කාර්යාලයේ වෙබ් අඩවියෙන් බාගත කරගැනීමට හෝ දැන්වීම් පුවරුවෙන් පිටපත් කර ගැනීමට හැකිය.

## 3. පොලිස් මූලස්ථානය මඟින් නිකුත් කරන පොලිස් නිෂ්කාෂණ වාර්තා

- සියලුම පොලිස් නිෂ්කාෂණ වාර්තා පොලිස් මූලස්ථානය මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයේ සටහන්ව පැවතිය යුතු අතර වෙනත් ලිපි ශීර්ෂවල සඳහන් ලේඛන භාරගනු නොලැබේ.

- මෙකී පොලිස් නිෂ්කාෂණ වාර්තාවට අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය, සහතිකය නිකුත් කළපොලිස් මූලස්ථානයේ බලයලත් නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව හා අදාළ පොලිස් නිෂ්කාෂණ වාර්තාව මගින් ආවරණය කරන කාල සීමාවන් නිවැරදිව සටහන් කොට තිබිය යුතුය.

## 4. පොලිස් ස්ථාන මඟින් නිකුත් කරන පොලිස් වාර්තා

- සියලුම පොලිස් වාර්තා පොලිස් 423 ආකෘතිපත්‍රයේ සටහන්ව තිබිය යුතු අතර වෙනත් ලිපි ශීර්ෂවල සඳහන් ලේඛන භාරගනු නොලැබේ.

- අදාළ වාර්තා ලබාගැනීම සඳහා පොලිස් ස්ථානයට මුදල් ගෙවූ පොදු 172 ලදු පත්‍රයේ මුල් පිටපතද ඒ සමග ඉදිරිපත් කළ යුතුය.

- මෙකී පොලිස් නිෂ්කාෂණ වාර්තාවට අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය, සහතිකය නිකුත් කළ පොලිස් ස්ථානාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව අදාළ පොලිස් නිෂ්කාෂණ වාර්තාව මගින් ආවරණය කරන කාල සීමාවන් නිවැරදිව සටහන් කොට තිබිය යුතුය.

## 5. විදේශ රටවල් මඟින් නිකුත් කරන පොලිස් වාර්තා

❖ මෙම අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයේ මැදිහත් වීමෙන් ලබාගන්නා ලද විදේශ පොලිස් වාර්තා අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සහතික කොට හෝ කොන්සියුලර් අංශයේ නිලධාරියෙකුගේ සහතික කිරීම යටතේ පමණක් සත්‍යාපනය කිරීම පිණිස භාර ගැනේ.

❖ අයදුම්කරුවන් පෞද්ගලිකව ගෙන්වාගනු ලබන විදේශ පොලිස් වාර්තා අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් සහතික කොට හෝ ශ්‍රී ලංකාවෙහි පිහිටි අදාළ රට නියෝජනය කරන තානාපති කාර්යාලය මඟින් සහතික කොට ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන සහතික නැවත අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යොමුකර සහතික කරවාගෙන සත්‍යාපනය කිරීම පිණිස මෙම අංශයේ පාලනයෙන් තොර කාලයක් ගතවන බව කාරුණිකව සලකන්න.

## 6. විදේශ ගමන් බලපත්‍ර පිටපත්

❖ ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරනලද විදේශ ගමන් බලපත්‍රයේ අයිතිකරුගේ ඡායාරූපය හා විස්තර ඇතුලත් පිටුව හා වෙනස් කිරීම් හා නිරීක්ෂණ ඇතුළත් පිටුව පමණක් සත්‍ය පිටපත් බවට සහතික කිරීම පිණිස භාර ගැනේ.

❖ මේ සමග ගමන් බලපත්‍රය ද ඉදිරිපත් කළ යුතු අතර ගමන් බලපත්‍රය ඉදිරිපත් නොකරන්නේ නම් ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව මගින් සහතික කරන ලද ගමන් බලපත්‍රයේ සහතිකකළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

## 7. අස්ථානගත වූ විදේශ ගමන් බලපත්‍ර සඳහා පොලිස් වාර්තා සත්‍යාපනය කිරීම

❖ අස්ථානගත වූ විදේශ ගමන් බලපත්‍ර සඳහා පොලිස් වාර්තා සත්‍යාපනය කරනු ලබන්නේ අදාළ විදේශ ගමන් බලපත්‍රය අස්ථානගත වූ බවට ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව මගින් නව විදේශ ගමන් බලපත්‍රයේ සටහන් යොදා පිටසන් කර ඇත්නම් පමණි.

❖ ඒ සමගම අදාළ වාර්තා ලබා ගැනීම සඳහා පොලිස් ස්ථානයට මුදල් ගෙවූ පොදු 172 ලදු පත්‍රයේ මුල් පිටපත ද ඉදිරිපත් කළ යුතුය.

## 8. පුරවැසි සහතිකය

- ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරනලද පුරවැසි සහතිකයේ මුල් ලේඛනය සමග එම දෙපාර්තුමේන්තුව විසින් මාස තුනක කාලයක් තුලදී සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

## 9. රියදුරු බලපත්‍ර

- මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනුලබන තොරතුරු උපුටනය පමණක් සහතික කරනු ලැබේ.
- මෙම උපුටනය සමග අදාළ රියදුරු බලපත්‍රය ද ඉදිරිපත් කළ යුතුය.
- ලංකා ඔටෝ මොබයිල් සංගමය විසින් නිකුත් කරනු ලබන ලේඛන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් සහතික කොට තිබිය යුතුය.

## 10.ජාතික හැඳුනුම්පත්

- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන ලිපියේ මුල් පිටපත පමණක් සත්‍යාපනය කරනු ලැබේ.
- මෙම ලිපිය සමග අදාළ ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

## 11.වෛද්‍ය සහතික

- වෛද්‍ය සහතික සත්‍යාපනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් සහතික කර ඇත්නම් පමණි.
- ආයුර්වේද වෛද්‍ය සහතිකයක් නම් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාව මගින් සහතික කර තිබිය යුතුය.

## 12.වරලත් හෝ වෘත්තීයවේදී ආයතන මඟින් නිකුත් කරන ලද සහතික

- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව පනතක් මගින් ස්ථාපිත කර ඇති වරලත් හෝ වෘත්තීයවේදී ආයතන මඟින් නිකුත් කරන ලද සහතික සඳහා අදාළ ආයතනය මගින් සහතික කරනු ලබන සත්‍ය පිටපත් පමණක් සත්‍යාපනය කරනු ලැබේ.
- ජාත්‍යන්තරව ස්ථාපිත හෝ විදේශීය රටක ස්ථාපිත වරලත් හෝ වෘත්තීයවේදී ආයතන මගින් නිකුත් කරනු ලබන සහතික අදාළ ආයතනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත දේශීය බලයලත් කාර්යාලය මගින් හෝ අදාළ ආයතනය පිහිටි රට නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත තානාපති කාර්යාලය මගින් සහතික කරනලද සත්‍ය පිටපත් සඳහා පමණක් සත්‍යාපනය කිරීම සිදුකරනු ලැබේ.

## 13.තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතන මඟින් නිකුත් කරනු ලබන සහතික

- ❖ පාඨමාලාව පවත්වන ලද ආයතනය මගින් සහතික කළ අදාළ සහතිකයේ සත්‍ය පිටපතක් සමග මුල් සහතිකය ඉදිරිපත් කළ යුතුය.
- ❖ අදාළ පාඨමාලාව පැවැත්වීම සඳහා එකී ආයතනය සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහතිකය නිකුත් කරන ලද කාලය සඳහා වලංගු ලියාපදිංචියක් ඇති බව තහවුරු කරමින් කොමිෂන් සභාව මඟින් ලබාදෙන ලිපිය සමඟ ඉදිරිපත් කළ යුතුය.
- ❖ සහතිකයේ සඳහන් පාඨමාලාවේ නාමය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන ලිපියේ සඳහන් පාඨමාලාවේ නාමයම විය යුතුය.

## 14.ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කරන විභාග සහතික

- ❖ අ.පො.ස. සාමාන්‍ය පෙළ, අ.පො.ස උසස් පෙළ සහ විභාග දෙපාර්තුමේන්තුව මගින් පවත්වන වෙනත් විභාග සහතික සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය අයදුම්පත්‍ර බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු අතර එම දෙපාර්තමේන්තුව මගින් කොන්සියුලර් අංශය වෙත සෘජුවම යොමු කරනු ලබන උක්ත විභාගවල සහතිකපත්‍ර පමණක් සත්‍යාපනය කරනු ලැබේ.

- ❖ විභාග දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කරනු ලබන කාඩ්පත මෙම අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර එක් සහතිකයක් සත්‍යාපනය කිරීම සඳහා කොන්සියුලර් අංශය මගින් රු 500/-ක් අයකරනු ලැබේ. මෙයට අමතරව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් එම දෙපාර්තුමේන්තුවේ සේවා සඳහා ගාස්තු අය කෙරේ.

## 15.පාසල් හැරයාමේ සහතික

- ❖ රජයේ පාසල්වල ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන සහතික හා අවශ්‍ය නම් පරිවර්තනය කරන ලද පිටපතද සත්‍යාපනය කරගැනීම සඳහා අදාළ පාසල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සහතික කරනලද මුල් පිටපත හා පරිවර්තිත පිටපතද ඉදිරිපත් කළයුතු අතර එම පිටපත් පමණක් සත්‍යාපනය කරනු ලැබේ.

## 16.පෞද්ගලික / ජාත්‍යන්තර පාසල් මඟින් නිකුත් කරන සහතික

- ❖ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි පෞද්ගලික / ජාත්‍යන්තර පාසැල් මගින් නිකුත් කරන ලේඛන සත්‍යාපනය කරගැනීම සඳහා පාසලේ ප්‍රධානියා විසින් සහතික කරනලද අදාල ලේඛනවල සත්‍ය පිටපත් මුල් ලේඛන සමග ඉදිරිපත් කළ යුතු අතර එම ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල්

ශාඛාව මගින් හෝ කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සහතික කර ඇත්නම් පමණක් සත්‍යාපනය කිරීම සඳහා භාර ගනු ලැබේ.

❖ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි කර නොමැති පෞද්ගලික / ජාත්‍යන්තර පාසැල් මඟින් නිකුත් කරන ලේඛන සත්‍ය පිටපතක් ලෙස පමණක් සහතික කරනු ලබන අතර ඒ සඳහා පාසලේ ප්‍රධානියා විසින් නිකුත් කර ඇති සහතිකවල මුල් පිටපත සමඟ පාසල් ප්‍රධානියා සහතික කරන ලද අදාල ලේඛනවල සත්‍ය ඡායා පිටපත් සහ අදාල පාසලේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලේඛනයේ සහතික කරන ලද සත්‍ය පිටපතක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

## 17.ආගමික හෝ සංස්කෘතික ආයතන මගින් නිකුත් කළ සහතික

❖ කිසියම් ආගමික හෝ සංස්කෘතික ආයතනයක් මඟින් නිකුත් කරනු ලැබූ සහතිකයක් සත්‍යාපනය කිරීම පිණිස භාරගනු ලබන්නේ අදාළ සහතිකය එකී විෂයය භාර රජයේ දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කර ඇති විට හෝ සහතිකය නිකුත් කළ ආයතනය එම විෂයය භාර දෙපාර්තුමේන්තුවේ ලියාපදිංචි වී ඇති බවට අදාළ රාජ්‍ය දෙපාර්තුමේන්තුව සහතික කොට ඇති විට පමණි.

## 18.දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් විදේශ විභාග සඳහා නිකුත් කර ඇති සහතික

❖ දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් විදේශ විභාග සඳහා බලයලත් විදේශ ආයතන මගින් නිකුත් කරනු ලබන සහතික, අදාළ ආයතනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත දේශීය බලයලත් කාර්යාලය හෝ අදාළ ආයතනය පිහිටි රට නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත තානාපති කාර්යාලය මගින් සහතික කරන ලද සත්‍ය පිටපත් සඳහා පමණක් සත්‍යාපනය කිරීම සිදු කරනු ලැබේ.

❖ කෙසේ වුවද එක්සත් රාජධානියේ ආයතන මඟින් නිකුත් කරන සහතික සඳහා මෙරට බ්‍රිතාන්‍ය මණ්ඩලය මගින් සහතික කරන ලද සත්‍ය පිටපත්ද ඇමෙරිකා එක්සත් ජනපද ආයතන මඟින් නිකුත් කරන සහතික සඳහා එක්සත් ජනපද ෆුල්බ්‍රයිට් කොමිසම මගින් සහතික කරන ලද සත්‍ය පිටපත්ද සත්‍යාපනය සඳහා සලකා බලනු ලැබේ.

## 19.පෞද්ගලික ආයතනවල සේවා සහතික

❖ පෞද්ගලික අංශයේ රැකියාවලට අදාළව සේවා සහතික සත්‍ය පිටපතක් ලෙස පමණක් සහතික කරනු ලබන අතර ඒ සඳහා සේවා සහතිකයේ මුල් පිටපත සමග අදාළ ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරන ලද සත්‍ය ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

❖ ඒ සමග අදාළ තනතුරෙහි පත්වීම් ලිපියේ මුල් පිටපත, උසස් වීම් ලබා ඇත්නම් ඒ බව තහවුරු කිරීමට අදාළ ලිපිවල මුල් පිටපත් හා අදාළ ආයතනයේ සේවයේ යෙදී සිටි අවසන් මාස තුනේ වැටුප් වාර්තා

හෝ සේවක අර්ථ සාධක, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායකත්ව මුදල් ගෙවන ලද ලේඛන ඉදිරිපත් කළ යුතුය.

❖ විධිමත් පත්වීමේ ලිපියක් හෝ අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවකදී සේවා සහතිකයේ මුල් පිටපත සමග අදාළ ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරන ලද සේවා සහතිකයේ සත්‍ය පිටපතක් සහ ප්‍රාදේශීය ලේකම් විසින් හෝ නිකුත් කළ බලධාරීයා විසින් සහතික කරන ලද ආයතනයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලේඛනයේ සත්‍ය පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

## 20.දේශීය විශ්වවිද්‍යාලවලින් ලබා ගන්නා ලද උපාධි සහතික

❖ උපාධි සහතිකයේ මුල් පිටපත සමඟ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් සහතික කරන ලද සත්‍ය පිටපතක් ඉදිරිපත් කළයුතු අතර එම ලේඛන අදාල විශ්වවිද්‍යාලය වෙතින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් සත්‍යාපනය කරනු ලැබේ.

❖ මේ සඳහා අදාළ විශ්වවිද්‍යාලය මඟින් ගන්නා කාලය මෙම ආයතනයේ පාලනයෙන් තොර බැවින් සිදුවන ප්‍රමාදයන් සම්බන්ධව අදාළ විශ්ව විද්‍යාලයෙන් විමසීම මැනවි.

## 21.විදේශ විශ්වවිද්‍යාලවලින් ලබා ගන්නා ලද උපාධි සහතික

❖ විදේශ විශ්වවිද්‍යාල මඟින් ලබා ගන්නාලද උපාධි සහතික සත්‍යාපනය සඳහා අදාල රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හෝ ශ්‍රී ලංකාවේ පිහිටි අදාල රටේ තානාපති කාර්යාලය මඟින් සත්‍ය බවට සහතික කළ පිටපත් මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

❖ කෙසේ වුවද එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාල මඟින් නිකුත් කරන සහතික සඳහා මෙරට බ්‍රිතාන්‍ය මණ්ඩලය මඟින් සහතික කරනලද සත්‍ය පිටපත්ද ඇමරිකා එක්සත් ජනපද විශ්වවිද්‍යාල මඟින් නිකුත් කරන සහතික සඳහා එක්සත් ජනපද ෆුල්බ්‍රයිට් කොමිසම මඟින් සහතික කරනලද සත්‍ය පිටපත්ද සත්‍යාපනය සඳහා සලකා බලනු ලැබේ.

## 22.දිවුරුම් ප්‍රකාශ හෝ ඇටෝර්නි බලපත්‍ර

❖ ශ්‍රී ලංකා පුරවැසියකු විසින් හෝ ශ්‍රී ලංකා සංස්ථාපිත පුරවැසියකු (corporate citizen)විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශ හෝ ඇටෝර්නි බලපත්‍ර පමණක් සත්‍යාපනය කිරීම පිණිස බාරගැනේ. ශ්‍රී ලංකා සංස්ථාපිත පුරවැසියකු විසින් ඒ බව සනාථ කිරීමට අදාල ලේඛන ඉදිරිපත් කළ යුතුය. (උදා- සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කළ Form 20 වැනි ලේඛන ද)

- ❖ සියලුම දිවුරුම් ප්‍රකාශ හෝ ඇටෝර්නි බලපත්‍ර අදාල පරිදි නීතිඥයකු විසින් සකස්කර ඇත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිවරයා හෝ සාමවිනිසුරුවරයකු සකසා ඇත්නම් අධිකරණ අමාත්‍යාංශයේ සාමදාන විනිශ්චයකාර අංශය මඟින් අනු අත්සන් යොදා සහතික කළ යුතුය.

- ❖ දිවුරුම් ප්‍රකාශ හා ඇටෝර්නි බලපත්‍ර මඟින් ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය බවට තහවුරු කිරීම සඳහා අදාල වන නිල ලේඛන නිසි පරිදි ඉදිරිපත් කළයුතු අතර සත්‍යාපනය කිරීමේ නිලධාරීන් සෑහීමට පත්වන පරිදි තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් නොකරන දිවුරුම් ප්‍රකාශ හා ඇටෝර්නි බලපත්‍ර සත්‍යාපනය කිරීමට භාරගැනීම ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කාරුණිකව සලකන්න.

- ❖ උප්පැන්න, විවාහ හා මරණ සහතික, ගමන් බලපත්‍ර, රියදුරු බලපත්‍ර, ජාතික හැඳුනුම්පත් ආදී රජය මඟින් නිකුත් කර ඇති හඳුනා ගැනීමේ ලේඛනවල සඳහන් තොරතුරුවල වෙනස්කම් ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශ සත්‍යාපනය කරනු ලබන්නේ අදාල ලේඛනය නිකුත් කරන ලද බලධාරියා ඉහත කී ලේඛනවල මුල් පිටපත්හි අදාළ සංශෝධනයන් සිදුකොට නිසි පරිදි සහතික කොට ඇත්නම් පමණි.

- ❖ දෙමාපියන් / නීත්‍යානුකූල භාරකරුවන් නොවන තුන්වන පාර්ශවයක් භාරයේ බාල වයස්කරුවන් විදේශගත කිරීම් සඳහා ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශ සත්‍යාපනය කිරීම පිණිස භාරගනු ලබන්නේ අදාළ බාල වයස්කරු එකී තුන්වන පාර්ශවය භාරයේ විදේශගත කරවීමට අධිකරණ අවසරයක් හෝ පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයාගේ අවසරයක් ලැබී ඇති විට පමණි.

- ❖ විදේශයක වාසය කරන ශ්‍රී ලාංකික පුරවැසියකුට තමන් සිටින රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ගොස් කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ බලයලත් නිලධාරියකු ඉදිරියේ මෙකී දිවුරුම් ප්‍රකාශ ලබාදීම හෝ ඇටෝර්නි බලපත්‍ර අත්සන් කිරීම කළ හැකිය.

## 23.අධිකරණ ලේඛන

- ❖ අධිකරණ ලේඛන සත්‍යාපනය කිරීම සඳහා අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද මුල් ලේඛනය ඉදිරිපත් කළයුතු අතර එම ලේඛන අදාල අධිකරණය වෙතින් තහවුරුකර ගැනීමෙන් අනතුරුව පමණක් සත්‍යාපනය කරනු ලැබේ.

- ❖ දික්කසාද සහතික සත්‍යාපනය පිණිස භාරගනු ලබන්නේ නියත තීන්දුව ලැබී ඇති විට පමණක් සහ එම නියත තීන්දුව සහිත ලේඛනය සඳහා පමණි. එසේ වුවද නෛසයි ආඥාව සහිත ලේඛනය ද මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. නෛසයි ආඥාව පමණක් සත්‍යාපනය කිරීම පිණිස භාර නොගන්නා බව කාරුණිකව සලකන්න.

**මෙකී ලේඛන අදාල අධිකරණය මඟින් තහවුරු කිරීමට ගන්නා කාලය මෙම ආයතනයේ පාලනයෙන් තොර බැවින් සිදුවන ප්‍රමාදයන් සම්බන්ධව අදාල අධිකරණයෙන් විමසීම මැනවි.**

## 24.දරුවන් කුලවැද්දීමේ සහතික

දරුවන් කුලවැද්දීමේ ලේඛන සත්‍යාපනය කිරීම පිණිස බාරගනු ලබන්නේ පහත සඳහන් ලේඛන ද සමඟ ඉදිරිපත් කළවිට පමණි.

- දිසා විනිසුරුවරයා විසින් නිකුත් කළ කුල වැද්දීමේ නියෝගය (Form 4)
- දරුවා කුලවද්දාදීම සඳහා ස්වභාවික දෙමාපියන්/භාරකරු විසින් අධිකරණයට කැමැත්ත පල කිරීමට නීතීඥයා විසින් සකස් කරන ලියවිල්ල (Form 2) (මෙය ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී විසින් සහතික කොට තිබිය යුතුය)
- පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් විසින් කුලවැද්දාගත් දෙමාපියන්ට නිකුත්කළ ලිපිය
- පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කළ ලිපිය
- දරුවාගේ උප්පැන්න සහතිකය
- රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත්කළ කුලවැද්දාගැනීමේ සහතිකය
- හේග් සම්මුතියේ 23 වගන්තිය යටතේ නිකුත් කළ අනුකූලතා සහතිකය (දරුවා කුලවැද්දාගන්නා දෙමාපියන් ශ්‍රී ලාංකික පුරවැසියන් නම් මෙම ලේඛනය අවශ්‍ය නොවේ.)

## 25.ග්‍රාම නිලධාරී සහතික

- ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතික මගින් සනාථ කළ හැක්කේ අදාල ග්‍රාම නිලධාරී වසම තුල පදිංචිය හෝ යැපීම් පිළිබඳ තොරතුරු පමණකි.
- මෙම සහතික ග්‍රාම නිලධාරී වාර්තා නිකුත් කරන DS 4 ආකෘති පත්‍රයේ සටහන් කොට ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබා ඇත්නම් පමණක් සත්‍යාපනය කිරීමට භාරගනු ලැබේ.

## 26.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් නිකුත් කරන පුහුණු සහතික

❖ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් නිකුත් කරන පුහුණු සහතික සත්‍යාපනය කිරීම පිණිස එම කාර්යාංශයේ බලයලත් නිලධාරියකු මඟින් සහතික කරවාගත් එම සහතිකයේ සහතික කළ පිටපතක් සමඟ මුල් සහතිකය ඉදිරිපත් කළ යුතුය.

## 27.විවිධ රාජ්‍ය ආයතන මඟින් කිසියම් ව්‍යවස්ථාපිත බලයක් යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර හෝ ලේඛන

❖ විවිධ රාජ්‍ය ආයතන මගින් එකී ආයතනයට හිමි ව්‍යවස්ථාපිත බලයක් යටතේ නිකුත් කළ ලේඛන හෝ බලපත්‍ර සත්‍යාපනය කිරීම පිණිස, එකී ලේඛනයේ හෝ බලපත්‍රයේ සත්‍ය පිටපතක් අදාළ නිකුත් කළ බලධාරියා මගින් සහතික කර මුල් ලේඛනය හෝ බලපත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

❖ මෙකී ලේඛන හෝ බලපත්‍රවල තොරතුරු අදාළ නිකුත් කළ බලධාරියා වෙතින් සනාථකර ගැනීමෙන් අනතුරුව පමණක් සත්‍යාපනය කරනු ලැබේ.

මේ සඳහා අදාළ රාජ්‍ය ආයතනය මඟින් ගන්නා කාලය මෙම ආයතනයේ පාලනයෙන් තොර බැවින් සිදුවන ප්‍රමාදයන් සම්බන්ධව අදාළ ආයතනයෙන් විමසීම මැනවි.

## 28. අපනයන ලේඛන-

❖ අපනයන ලේඛන සත්‍යාපනය පිණිස භාරගත හැක්කේ එම ලේඛනවල ප්‍රභවස්ථාන සහතික (Certificate of Origin), මෙම අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති වාණිජ මණ්ඩලයකින් නිකුත් කරනු ලදුව එකී සියලුම ලේඛනවලනිල මුද්‍රා තබා සහතික කොට ඇත්නම් පමණි.

❖ අපනයන ලේඛන කට්ටලයක් සත්‍යාපනය කිරීම පිණිස රුපියල් 6000/= ගාස්තුවක් අය කෙරේ. ප්‍රභවස්ථාන සහතික (Certificate of Origin) කට්ටල කිහිපයක් ඇත්නම් ඒ එක් එක් කට්ටලය වෙනුවෙන් වෙන වෙනම ගාස්තු අය කෙරේ. එක් අපනයන ලේඛන කට්ටලයක පහත සඳහන් ලේඛන ඇතුලත් විය හැකිය.

✓ ප්‍රභවස්ථාන සහතිකය (Certificate of Origin)
✓ ඉන්වොයිසිය / වෙළෙඳ ඉන්වොයිසිය (Invoice/ Commercial Invoice)
✓ නෞභාර පත්‍රය (Bill of Lading)
✓ සෞඛ්‍ය සහතික (Health Certificate)
✓ විද්‍යාගාර පරීක්ෂණ සහතික (Laboratory Certificates)
✓ විශ්ලේෂණ වාර්තා (Analysis Reports)
✓ ස්වස්ථතා සහතික (Phytosanitary Certificates)
✓ නිරෝධායන සහතික (Quarantine Certificates)

- ✓ පාර්ශවකරුවන්ගේ පිටපත (Party's copy)

මෙම ලේඛනවලට අමතරව ප්‍රභවස්ථාන සහතිකය (Certificate of Origin) නොමැතිව පහත සඳහන් ලේඛන ද වෙන වෙනම සත්‍යාපනය කිරීම පිණිස භාරගනු ලබන අතර ඒ එක් ලේඛනයක් සඳහා රුපියල් 800/= ක ගාස්තුවක් අයකෙරේ.

- ✓ සෞඛ්‍ය සහතික (Health Certificate)
- ✓ විද්‍යාගාර පරීක්ෂණ සහතික (Laboratory Certificates)
- ✓ විශ්ලේෂණ වාර්තා (Analysis Reports)
- ✓ ස්වස්ථතා සහතික (Phytosanitary Certificates)
- ✓ නිරෝධායන සහතික (Quarantine Certificates)
- ✓ නිදහස් විකිණීම් සහතික (Free Sale Certificates)
- ✓ තත්ව හා ප්‍රමිති සහතික (Quality and Standards Certificates)
- ✓ දිවුරුම් ප්‍රකාශ හා ඇටෝර්නි බලපත්‍ර (Affidavits and Power of Attorneys) (ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් සහතික කොට තිබිය යුතුය)
- ✓ පාර්ශවකරුගේ පිටපත

## 29.ව්‍යාපාරික ලේඛන

**a.** **සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය**

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරනලද සමාගමේ ලියාපදිංචි සහතිකයේ සහතිකකළ පිටපතක් සමග මුල් ලේඛනය ද ඉදිරිපත් කළයුතු අතර එසේ නැතහොත් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් සමග ආසන්නම කාල සීමාව සඳහා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට බදු මුදල් ගෙවූ රිසිට් පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. මේ සමග 20 ආකෘති පත්‍රය ද (Form 20) ඉදිරිපත් කළ යුතුය.

**b.** **ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික**

ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකවල එය නිකුත්කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සහතික කරනලද පිටපතක් මුල් ලේඛනය සමග ඉදිරිපත් කළයුතු අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ රිසිට් පත ද ඉදිරිපත් කළ යුතුය.

**c.** **සමාගම් ව්‍යවස්ථා (Articles of Association) හා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ (Board Resolutions)**

සමාගම් ව්‍යවස්ථා හා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සත්‍යාපනය කිරීම පිණිස පහත සඳහන් ක්‍රමවේදයන් දෙකින් එකක් අනුගමනය කළ හැකිය.

- සමාගම් ව්‍යවස්ථා හා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ ලියාපදිංචි කළයුතු අතර එකී ලියාපදිංචි කළ ලේඛනයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහතික කළ පිටපතක් ද ඉදිරිපත් කොට සත්‍යාපනය කළ හැකිය.

- සමාගම් ව්‍යවස්ථා හා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල මුල් ලේඛන සමාගමේ නීති නිලධාරියා හෝ සමාගම් ලේකම්වරයා (නීතිඥයෙකු වන්නේ නම් පමණක්) ඉදිරියේ අදාළ අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් තබා නීති නිලධාරියා හෝ සමාගම් ලේකම්වරයා විසින් සහතික කොට ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී විසින් සහතික කළ පසු සත්‍යාපනය පිණිස භාරගැනේ. සමාගම් ලේකම්වරයා නීතිඥයෙකු නොවන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී වෙනුවට අදාළ ලේකම්වරයාට සමාගම් ලේකම්වරයකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රය නිකුත් කළ ආයතනය (උදා- වරලත් ලේකම්වරුන්ගේ ආයතනය) විසින් අදාළ ලේකම්වරයාගේ අත්සන සහිත ලේඛන සහතික කොට ඉදිරිපත් කළ යුතුය.

ඉහත අවස්ථා දෙකම සඳහා අදාළ ලේඛන සමග 20 ආකෘති පත්‍රය ද ඉදිරිපත් කළ යුතුය.

**d.** **20 ආකෘති පත්‍රය (Form 20)**

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරනලද සමාගමේ 20 ආකෘති පත්‍රයේ (Form 20) සහතික කළ පිටපතක් සමග මුල් ලේඛනය ඉදිරිපත් කළ යුතුය.

මේ සමග සමාගමේ ලියාපදිංචි කිරීමේ සහතිකය ද ඉදිරිපත් කළ යුතුය.

**e.** **විගණන ගිණුම් වාර්තා (Audited Accounts Reports)**

විගණන ගිණුම් වාර්තා වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් සහතිකකොට තිබිය යුතු අතර අදාළ වරලත් ගණකාධිකාරීවරයාට බලපත්‍රය නිකුත් කළ ආයතනය (උදා-: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය) විසින්අදාළ විගණන ලේඛනවල එකී වරලත් ගණකාධිකාරීවරයාගේ ලියාපදිංචිය පිළිබඳව සහතික කොට තිබිය යුතුය.